*Proceedings of the Sixth Academic Sessions, University of Ruhuna 2009*
*Vol. 6 pgs 136 - 149*

# සිංහල භාෂාවෙහි න-ණ, ල-ළ අක්ෂර භාවිතය පිළිබඳ අද්‍යතන ගැටලු

**ධර්මා රාජපක්ෂ**
සිංහල අධ්‍යයන අංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
✉ *ruhunuhewa@pbs.ruh.ac.lk*

**සාරාංශය**

ණ,න - ළ, ල වාදය නොහොත් ණකාර – නකාර වාදය අපට මුල්වරට අසන්නට ලැබෙන්නේ ක්‍රි.ව 1902 දී ය. සරසවි සඳරැස නම් පුවත්පත හරහා මේ දීර්ඝතර ශාස්ත්‍රීයවාදය සිදු විය. ක්‍රි.ව.1987 දී යළිත් වතාවක් සිංහල භාෂාවේ ණ, න - ළ, ල අක්ෂර යෙදීමේ දී මතුවන ගැටලු සහ දුෂ්කරතා පිළිබඳ ව දිවයිනේ සිටින ඉහළ මට්ටමේ භාෂා ශාස්ත්‍රඥයන්ගේත් විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගේත් සහභාගිත්වයෙන් දින හතරක් මුළුල්ලේ ශාස්ත්‍රීය සම්මේලනයක් පැවැත්විණි. මේ කුමන අයුරින් වාද විවාද පැවතියත් මේ සම්බන්ධ ගැටලුව අද වනතුරුත් නිරාකරණය වී නැත. 2008 වසරෙහි සාහිත්‍ය සම්මානය දිනා ගත් "අටවක පුත්තු" නම් නවකතාවේ මූර්ධජ "ණ" සහ මූර්ධජ "ළ" යන අක්ෂර එකක්වත් දක්නට නොමැත. අද්‍යතන බොහෝ පුවත්පත්වලින් මේ පිළිබඳ විවෘත සංවාද දියත් වෙන අයුරු ද දක්නට ලැබෙයි. එක ම ශබ්දයක් දෙන අක්ෂර දෙකක් සිංහල හෝඩියට අවශ්‍ය නැතැ යි ඇතැමෙක් පවසති. සාම්ප්‍රදායික ණ, න - ළ , ල යෙදීමේ ක්‍රමවේදය පිළිබඳ ව විධිමත් නිරීක්ෂණයක යෙදෙමින් මේ නවීන ගැටලු .විමර්ශනය කිරීම මේ අධ්‍යයන පත්‍රිකාවේ අරමුණ වෙයි.

**යොමු වචන:** ණ, න සහ ළ, ල යෙදීමේ පිළිගත් සාම්ප්‍රදායික රීතී , අටවක පුත්තු නම් නවකතාව, බස නැසීම සහ බස රැකීම

## හැඳින්වීම.

සිංහල භාෂාවෙහි න-ණ, ල-ළ යෙදීම සම්බන්ධ ව පවතින විවිධ ගැටලු, එක් එක් වකවානුවල දී සාකච්ඡාවට බඳුන් කොට තිබුණු අයුරු මෑතකාලීන ඉතිහාසගත තොරතුරු මැනවින් කියා පායි. 2008 සැප්තැම්බර් මාසයේ දී ලියනගේ අමරකීර්ති නම් ලේඛකයාගේ 'අටවක පුත්තු' නම් නවකථාව සඳහා වසරේ සාහිත්‍ය සම්මානය හිමි වීමත් සමග යටපත් වී තිබූ මේ කතිකාව යළිත් හිස එසවූයේ ය. ඊට හේතුව වූයේ එම නවකථාවෙහි කිසිදු ස්ථානයක මූර්ධජ ණ, ළ, ඪ සහ ෂ යන අක්ෂර භාවිත කොට නො තිබීම යි. එය කතුවරයා විසින් ඕනෑකමින් ම සිදු කරන ලද්දක් බව ප්‍රකාශ කිරීම නිසාත්, ඊට සාහිත්‍ය සම්මානය හිමි වීම නිසාත් එකී කරුණ, ශාස්ත්‍රයට සහ ව්‍යාකරණ රීති ගරු කරන බොහෝ විද්වතුන්ට මහත් කම්පනයක් ගෙන දුන්නේ ය. "බස සුරකින්නෝ බස වනසන්නෝ නො වෙත් වා" (ලංකාදිප, 2008 ඔක්. 14), අක්ෂර භාවිතය විකෘතියෙන් 'අටවක පුත්තු' නිර්මාණයට ආලෝකයක් ලැබේ ද? (ලංකාදීප, 2008 නොවැ. 11), බස නො දන්නා බකපණ්ඩිතයන් න-ණ, ල-ළ නො සැලකීම මෝස්තරයක් කරගෙන (ලංකාදීප, 2008 දෙසැ. 23), හිතුමතේට භාෂා රීති කඩන අය වළං කඩේට පැනපු ගොනුන් වගෙයි (ලංකාදිප 2008 නෙවැ. 20) යනාදි වශයෙන් පුවත්පත්වලින් ඒ පිළිබඳ ව පළ කොට තිබූ ලිපි රචනා ඊට දෙස් දෙයි. කෙසේ නමුත් ලියනගේ අමරකීර්ති ප්‍රකාශ කොට සිටින්නේ නිර්මාණශීලී ලේඛනය සාම්ප්‍රදයික අක්ෂර වින්‍යාසය තුළ සිර නො

කළ යුතු බව යි. (ලක්බිම, 2008 සැප්. 28) සිංහලය සුබනම්‍ය සහ ස්වාධීන බසක් බවත්, එය තව දුරටත් එහි මව් භාෂා යැයි සැලකෙන සංස්කෘත වැනි භාෂාවල හෙවණැල්ල යට සිර කොට තැබිය යුතු නැති බවත්, සිංහලයෙහි චිර පැවැත්ම සඳහා එය හැකි තරම් ලිහිල් කළ යුතු බවත්, ළ, ඨ, ණ, ෂ අකුරු හතර වෙනුවට ල, ලු, න, ශ යෙදීමෙන් සිංහලයේ කිසි ම වචනයක අර්ථය විකෘති නො වන බවත්, වචනවල අර්ථය එන්නේ සංදර්භයෙන් මිස අක්ෂර වින්‍යාසයෙන් නො වන බවත් ලියනගේ අමරකීර්ති පවසයි. (එම) එසේ ම 21 වැනි සියවසේ දී සිංහල වැනි කුඩා භාෂාවලට ස්වපැවැත්ම සඳහා යම් යම් 'රැඩිකල් තීන්දු' ගැනීමට සිදු වී ඇති බව ද, ඒ සඳහා තමා සංස්කරණවාදියෙකු ලෙස පෙනී සිටින බව ද, කිසියම් එඩිතර තරුණ පිරිසක් එකතු වී ළ, ඨ, ණ, ෂ අකුරු නැති පුවත්පතක් පළ කළ යුතු බව ද ඔහු තව දුරටත් කියා සිටී. (එම) මේ අනුව ඉහත කී අක්ෂර හතර පිළිබඳ ගැටලුව ඔහු යළිත් වරක් සමාජගත කොට තිබේ. මේ පර්යේෂණය ඒ පිළිබඳව යි.

**ක්‍රමවේදය**

මෙහි අධ්‍යයන ක්‍රමවේදය මුළුමනින් ම ද්විතියික මූලාශ්‍රය මත පදනම් වී ඇත. න, ණ, ල, ළ ගැටලුව සම්බන්ධයෙන් මෙතෙක් සිදු කොට ඇති අධ්‍යයන ද, සම්මත සිංහල කම්ටු වාර්තාව ද ආශ්‍රය කොටගෙන එකී ගැටලුව විභාග කොට බැලීම මෙයින් අපේක්ෂිත ය.

**විග්‍රහය**

අක්ෂර වින්‍යාසය පිළිබඳ ව අමරකීර්ති විසින් ඉදිරිපත් කරනු ලැබූ නූතනවාදී අදහස් යථෝක්ත පරිදි වුවත් මෙකී සංස්කරණවාදී මතිමතාන්තරවල ප්‍රභවය 19 සියවස දක්වා දිව යයි. සැබැවින් ම සිංහල න-ණ, ල-ළ යන අකුරු සතරෙහි භාවිතය පිළිබඳ ලේඛන ගැටලු කෝට්ටේ යුගය තෙක් ම දක්නට ලැබුණේ නැත. (පොන්නම්පෙරුම අමරසිරි, 1987:17) එහෙත් 16 වැනි සියවසේ ආරම්භයේ සිට ශ්‍රී ලංකාව විවිධ යුරෝපීය ජාතීන්ගේ ආක්‍රමණවලට ලක් වීම නිසා සිංහල භාෂා සාහිත්‍යයේ ක්‍රමික වර්ධනයට බාධා පැමිනුණි. ඒ අනුව පාරම්පරික අධ්‍යාපන ක්‍රමයේ බිඳ වැටීම හේතු කොටගෙන සිංහල භාෂා උගතුන්ගේ සංඛ්‍යාව ද හීන වී, ග්‍රන්ථකරණය ද දුර්වල මට්ටමකට ඇද වැටුණේ ය. (අරංගල රත්නසිරි 1992:32) සිංහලයෙහි න ,ණ , ල, ළ භාවිතය පිළිබඳ ව එතෙක් පිළිගෙන තිබූ සම්මතය ද මහනුවර සමය වන විට ව්‍යාකූලතාවකට පත් වී තිබූ හෙයින් 19 වැනි සියවසේ මැද භාගයෙන් පසු ව බිහි වූ පුවත්පත්කරුවන්ට එකී සංකීර්ණ ස්වභාවය ම උරුම වූයේ ය.

19 වන සියවසේ අග භාගයේ දී සිංහල භාෂා සාහිත්‍යයේ පුනර්ජීවනයක් දක්නට ලැබුණු අතර මිෂනාරී පාඨශාලාවලට එරෙහි ව බෞද්ධ පාඨශාලා ගොඩනැගීමත්, එසේ ම පිරිවෙන් නගා සිටුවීමත් නිසා පැරණි සිංහල ග්‍රන්ථ මුද්‍රණය කිරීමේ අවශ්‍යතාව ද දැඩි විය. සිංහල අක්ෂර වින්‍යාසය පිළිබඳ විධිමත් දැනීමක් නො ලැබ සිටි මේ ග්‍රන්ථ සංස්කාරකවරු මහත් අපහසුතාවකට පත් වූහ. මෙහි දී ඇතැමෙක් පාළි සංස්කෘත භාෂාවල අක්ෂර වින්‍යාස රටාව අනුගමනය කළහ. ඒ අනුව ප්‍රාචීන භාෂා පිළිබඳ ප්‍රවීණ දැනුමක් ලබා සිටි රත්මලානේ ධර්මාරාම හිමියෝ, සිංහලයෙහි ආවේණික රීති ඇති දැයි සෙවීමට පර්යේෂණයෙහි නිරත වූහ. එහි ප්‍රතිඵල වශයෙන් සංස්කෘත පාලි ආදී මාතෘ භාෂාමය රීතීන්ට පටහැණි වූ අක්ෂර යෝජනා ක්‍රමයක් සිංහලයෙහි ඇති බව උන්වහන්සේ පසක් කොට දුන්හ. 1982 දී උන්වහන්සේ විසින් 'සත්‍ය සමුච්චය' නම් කෘතිය මගින් ස්වකීය පර්යේෂණයෙහි ප්‍රතිඵල ලෝකයා වෙත හෙළිපෙහෙළි කරන ලදී. ධර්මාරාම හිමියන්ගේ අක්ෂර වින්‍යාසය පිළිබඳ මතය හෙළිදරව් වීමෙන් පසු ක්‍රි.ව. 1902 අප්‍රේල් 8 වැනි දින 'සරසවි සඳරැස' නම් පුවත්පතෙහි දෙඩන්දූවේ ධර්මසේන නම් වියතෙකු විසින් ණ-න, අක්ෂර යෝජනය පිළිබඳ ලිපියක් පළ කෙරිණි. මෙය සිංහල සාහිත්‍ය වංශයේ මහඟු සටහනක් තැබූ ණ-න, ල-ළ වාදය ප්‍රභව වීමට හේතුව වූයේ ය. (තිලකරත්න මිණිවන් පී, 1989: 85) පසු ව දෙඩන්දූවේ ධර්මසේන සහ ඇම්. සී. පෙරේරා යන නම්වලින් මේ වාදය ගෙන යන ලද්දේ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් සහ රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමියන් බව ද පැවසේ.

(එම) කෙසේ නමුත් විසිවන සියවසේ මුල් භාගයේ දී පවා න, ණ, ල, ළ සම්බන්ධයෙන් පැහැදිලි වැටහීමක් ස්ථාපිත ව නො තිබුණ බව ඉහත සඳහන් කළ "ණ කාර න කාර වාදය" සාක්ෂි සපයයි.

ක්‍රි.ව. 1875 දී පිහිටවනු ලැබූ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන සහ ඒ ආසන්න කාලයක ස්ථාපිත වූ කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ජාතික විමුක්ති අරගලයට ඒකාබද්ධ ව භාෂා සාහිත්‍ය ඔසවා තැබීමේ සුවිසල් කාර්යභාරයක නිරත විය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි විද්‍යෝදය පිරිවෙන ද, ශ්‍රී ධර්මාරාම නාහිමි විද්‍යාලංකාර පිරිවෙන ද නියෝජනය කළහ.

කෙසේ නමුත් මේ ශාස්ත්‍රීය වාදය කෙළවර වූයේ අවශ්‍ය ප්‍රතිඵල ළඟා කර ගනිමින් නො වේ. ගුරුකුල දෙකෙහි මතවාද පෙරටු කර ගනිමින් හා උනුන් වෙත උපහාස පරිහාසාදිය එල්ල කොට ගනිමින් අවසානයේ දී හුදෙක් පාණ්ඩිත්‍යය විදහා පෑම උදෙසා ම යොමු වූ මේ වාදය පුවත්පතෙහි කතුවරයා විසින් ම සමාප්තියට පත් කොට ඇත. (අරංගල රත්නසිරි, 1992: 37) එහි දී ඔහු සඳහන් කොට තිබුණේ "අගතිගාමී නො වී හොඳින් කල්පනා කර බලන අයට, පළ වූ ලියුම්වලින් කාරණය ගැන නිශ්චයකට පැමිණිය හැකි වෙයි." කියා යි. එහෙත් ඊට පසු කලෙක ලියැවුණු බොහෝ පොත්පත්වලින් පෙනී යන්නේ උගතුන් අතර මේ පිළිබඳ ව ඒකමතිකත්වයක් දක්නට නො ලැබුණු බව යි.

පුවත්පත තුළ මේ වාදය මෙසේ සමාප්තියට පත් වුවත් ප්‍රධාන ගැටලුව නිරාකරණය වූයේ නැත. එබැවින් ශාස්ත්‍රයට ලැදි විද්වත්හු මේ සම්බන්ධ ව අධ්‍යයනය කරන්නට වූහ. ඩබ්. ඇෆ්. ගුණවර්ධන ඉන් එක් සුවිශේෂ ශාස්ත්‍රඥයෙකි. එහි දී ධර්මාරාම හිමියන් විසින් හෙළිපෙහෙළි කරන ලදු ව විද්‍යාලංකාර රීතිය නමින් ප්‍රකට වූ අක්ෂර වින්‍යාස ක්‍රමය ඔහුගේ පැසසුමට ලක් විය.

"එහෙත් ශ්‍රී ධම්මාරාම නායක ස්වාමීන් වහන්සේ විසින් කරන ලද විශේෂ ශාස්ත්‍රසංග්‍රහය නම්, ශුද්ධ සිංහල භාෂාවෙහි පෙර පැවති ණ-න, වර්ණයන්ගේ හා ළ-ල වර්ණයන්ගේ ව්‍යවහාරය සම්බන්ධ වූ රීතිය සොයා ගැනීම යි. මේ වර්ණයන් අතරින් ණ-න, වර්ණයන්ගේ වනාහි සංස්කෘත ව්‍යවහාරයෙන් වෙනස් වූ යම්කිසි ව්‍යවහාර රීතියක් ශුද්ධ සිංහලයෙහි ඇති විය. එසේ ම ශුද්ධ සිංහලෙහි තද්භව නොවූ නිෂ්පන්න ළ කාරයක් ද කිසි ශබ්ද කෙනෙකුන් කෙරෙහි ළ කාරයාගේ ආදිවර්ණභාවයෙක් ද ඇති විය."

(ගුණවර්ධන ඩබ්. ඇෆ්., 1907: xxixa)

මේ අදහස් ව්‍යාප්ත වීමත් සමග එහි ප්‍රතිඵල ලෙස අවසානයේ දකින්නට ලැබුණේ විද්‍යාලංකාර සහ විද්‍යෝදය යන පිරිවෙන් අතර වෙනස් මත දරන විද්වත් පිරිස් පහළ වීම යි. න-ණ, ල-ළ යෙදීම පාලි සංස්කෘත රීති අනුව සිදු කිරීම වඩාත් යෝග්‍ය බව විද්‍යෝදය පිරිවෙනෙහි ශාස්ත්‍රධරයන් ප්‍රකාශ කළ අතර සිංහලයෙහි නිෂ්පන්න ණ කාරයක් සහ ළ කාරයක් ඇති බැවින් සිංහල රූඪියට අනුව එය යෙදීම වඩාත් යෝග්‍ය බව විද්‍යාලංකාර විද්වත්තු ප්‍රකාශ කළහ. මෙහි දී මෙකී පිරිවෙන් දෙකෙහි ම මත මැනවින් පරීක්ෂා කොට විද්‍යාලංකාර මතය වඩාත් ප්‍රශස්ත බව කුමාරතුංගයෝ ද පැවසූ හ. (පොන්නම්පෙරුම අමරසිරි 1989:95) මේ අනුව මේ විද්‍යායතන දෙකෙන් උසස් අධ්‍යාපනය හැදෑරූ බොහෝ සිසුන්ට ණ-න, ළ-ල සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් වූ ලක්ෂණ පිළිගැනීමට සිදු වන්නට ඇති බව සිතිය හැකි වෙයි. මේ පිරිවෙන් ආයතන දෙක විසින් ඉදිරිපත් කරනු ලැබූ මූලික ලක්ෂණ විමර්ශනය කොට වගුගත කළ කල්හි ඒ මෙ පරිදි වෙයි.

ප්‍රධාන ගුරුකුල දෙකෙහි මතවාද

| මාතෘ භාෂා (පාළි, සංස්කෘත) රීතිය සහ සිංහල රීතිය මිශ්‍ර ව සැලකීම | සිංහලයට අවේණික රීතිය අනුගමනය කිරීම |
|---|---|
| විද්‍යෝදය | විද්‍යාලංකාර |
| ධාතු ප්‍රකෘතිය අග | |
| කර+ණ = කරණ | කර+න = කරන |
| මර+ණ = මරණ | මර+න = මරන |
| දර+ණ = දරණ | දර+න = දරන |
| හර+ණ = හරණ | හර+න = හරන |
| වර+ණ = වරණ | වර+න = වරන |
| විසුර+ණ = විසුරණ | විසුර+න = විසුරන |
| | බල+න = බලන |
| | රකි+න = රකින |
| | කොට+න = කොටන |
| | දෙ+න = දෙන |
| අතීත කෘදන්ත නාමය | |
| කැඩුන | කැඩුණ |
| කොටන | කෙටුණ |
| යැවුන | යැවුණ |
| කැපුන | කැපුණ |
| බැලුන | බැලුණ |
| මැරුන | මැරුණ |
| පැලුන | පැලුණ |
| වැටුන | වැටුණ |
| එරුන | එරුණ |
| කෙරුන | කෙරුණ |
| මිරිකුන | මිරිකුණ |
| බැබළුන | බැබළුණ |
| අතීත කර්මකාරක ආඛ්‍යාත | |
| කැඩුනේ | කැඩුණේ |
| බැබළුනේ | බැබළුණේ |
| මැරුනේ | මැරුණේ |
| කැපුනේ | කැපුණේ |
| ලියැවුනේ | ලියැවුණේ |
| ඉපදුනේ | ඉපදුණේ |
| ගෞරවාර්ථ ප්‍රත්‍ය | |
| පියාන | පියාණ |
| පුතනු | පුතණු |
| දියනි | දියණි |
| සිටාන | සිටාණ |
| සංස්කෘත සහ පාලි වචන | |
| පුණ්‍ය > පිණ | පින |
| පරිවේණ > පිරිවෙණ | පිරිවෙන |
| ප්‍රාණ > පණ | පන |
| ව්‍රණ > වණ | වන |
| ආණි > ඇණ | ඇන |
| භණ > බණ | බන |
| ලෝණ > ලුණු | ලුනු |
| තෘණ > තණ | තන |

විද්‍යෝදය සහ විද්‍යාලංකාර යන ආයතන දෙකෙහි න, ණ , ල, ළ සම්බන්ධ මතභේදාත්මක ප්‍රභේදගත කිරීම ඉහතින් වගුගත කොට ඇත. විද්‍යාලංකාර රීතිය අනුව මූර්ධජ ණ, ළ අක්ෂර තත්සම හෝ තද්භව හෝ වචනවල පමණක් නො ව නිෂ්පන්න වචනවල ද යෙදෙයි. ගෞරවාර්ථයේ ආණ / අණු ආදි ප්‍රත්‍යයන්හි ද හෙළ වැනි තැන්වල ද යෙදෙන්නේ නිෂ්පන්න ණ, ළ අක්ෂර යි. (අරංගල රත්නසිරි :39)

ධර්මාරාම හිමියන් විසින් හෙළි කරන ලදු ව විද්‍යාලංකාර රීතිය නමින් ප්‍රකට වූ අක්ෂර වින්‍යාස ක්‍රමය ඩබ්. ඇෆ්. ගුණවර්ධන, මුනිදස කුමාරතුංග ආදි පඬිවරුන් විසින් ද, තත්කාලීන ප්‍රධාන සිංහල පුවත්පත් සහ ලේඛක පරපුර විසින් ද ශ්‍රීමත් ඩී.බී. ජයතිලකගේ මාර්ගයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ද පිළිගනු ලැබ සම්මත අක්ෂර වින්‍යාස රීතිය බවට බහුතරයේ පිළිගත් සම්මතයක් ඇති විය. (එම)

ඒ අනුව වත්මනෙහි ක්‍රියාත්මක වන්නේ එසේ පිළිගනු ලැබූ සම්මත රීතිය යි. 1968 දී පළ වූ සම්මත සිංහලය නම් වාර්තාවෙහි න-ණ, ල-ළ සහ ශ-ෂ යෝගය පාසල්වල ඉගැන්විය යුතු අන්දම සහ පාසල් පොත් රචනා කිරීමේ දී අනුගමනය කළ යුතු රීතිය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලදි. එය පහත පරිදි වෙයි.

**න-ණ- ල-ළ ප්‍රයෝගය**

සිංහල ව්‍යවහාරයෙහි න - ණ - ල - ළ ප්‍රයෝගය පිළිබඳ ව එක්තරා සාම්ප්‍රදායික ක්‍රමයක් ජයවර්ධනපුර යුගය අවසන තෙක් අනුගමනය කැරුණු බව පැරැණි සාහිත්‍ය ග්‍රන්ථවලින් ද සෙල් ලිපි ආදියෙන් ද පෙනේ. ඉන් පසු ව සීතාවක සමයේ සිට සිංහල ව්‍යවහාරය ක්‍රමයෙන් පිරිහීම් අතට හැරිණි. මේ අවධියෙහි න - ණ - ල - ළ වහර බෙහෙවින් අවුල් ව ගිය සේ ය. විසි වන සියවස මුල් භාගයේ සිට න - ණ - ල - ළ වහර පිළිබඳ ශාස්ත්‍රීය අදහස් බොහෝ විද්වතුන් විසින් පළ කරන ලදී. එහෙත් මෙ තෙක් දු ඇතැම් තැන් නිශ්චය වී නැති බව ම කිය යුතු ව ඇත.

මේ කමිටුවෙන් කැරුණේ පැරණි ඡේකව්‍යවහාරයත් නූතන විද්වතුන් ගේ අදහසුත් විමසා බලා ශාස්ත්‍රීය යුක්තියට අනුව න - ණ - ල - ළ යෙදිය යුතු සේ නිර්දේශ කිරීම යි. මූර්ධන්‍ය ණකාර ළකාර යන

දෙකේ ව්‍යවහාරය නිශ්චිත වූ කල්හි ශේෂය දාන්ත්‍ය නකාර ලකාර වන හෙයින් ණකාර ළකාර දෙකේ යෙදුම පමණක් මෙහි දැක්වේ.

සිංහලයෙහි ණකාර ළකාර ප්‍රයෝගය දෙ පරිද්දෙකින් සිටී ;

(1) සිදත් සඟරායෙහි දැක්වෙන හෝඩියෙන් ම ලියැවෙන ප්‍රබන්ධවල වෙසෙසින් සිංහල පැදි බසෙහි දක්නට ලැබෙන ණකාර ළකාර ප්‍රයෝගය එකෙකි.

(2) සාමාන්‍ය ගද්‍ය ලිපියෙහිත් ඇතැම් විට කථා ව්‍යවහාරයෙහිත් යෙදෙන සංස්කෘත ආදි භාෂාවලින් ගැනුණු ශබ්ද රූපවල ණකාර ළකාර ප්‍රයෝගය අනෙක ය.

**මූර්ධන්‍ය ණකාර යෝගය**

ණකාරය ද නිෂ්පන්න, තත්භව, තත්සම යන ත්‍රිවිධාකාරයට සිංහලයෙහි යෙදේ.

**නිෂ්පන්න ණකාරයට නිදසුන්:**

1. **සකර්ම ධාතුවෙකින් සැදෙන අතීත කාල කර්මකාරක ආඛ්‍යාතය සිංහලයෙහි ණකාරවත් ව ම සිටී.**

   උදාහරණ :

   ගොවියන් විසින් ගොයම් <u>කැපිණි</u>.

   ඒ උත්සවයට පළාතේ සියලු ප්‍රභූහු <u>කැඳැවුණු</u>.

   ඔවුන් විසින් අපි <u>රැවැටුණුමු</u>.

   දැවිණි, දැවිණ, දැවුණු, රැකිණි, රැකිණ, රැකුණු ඈ සෙසු තැන් ද සලකන්න.

2. **අතීත කාල නිරුත්සාහක ක්‍රියා පද හෙවත් ආත්මනේ පද ආඛ්‍යාත රූපත් මූර්ධන්‍ය ණකාරවත් ව සිටී.**

   නිදසුන් :

   තොප දැකුමෙන් අප පින් කළ බව <u>දැනිණි</u>.

   <u>පෙනිණි</u> සුවාසු දහසෙක් හිමවු කුළු.

   <u>බැබැළිණි</u> නැඟී පුන් තරිඳා පෙර අඹරේ.

3. **අතීතකාල කෘදන්ත පද ද ණකාරවත් ව සිටී.**

   බිඳුණු, බිඳුණේ, බිඳුණෝ

   වැටුණු, වැටුණේ, වැටුණෝ

   පැසුණු, පැසුණේ, පැසුණෝ

   ආදිය නිදසුනි.

4. **ගෞරවාර්ථය හඟවනු පිණිස යෙදෙන ආණ, අණු, අණි, අණ්ඩ යන ප්‍රත්‍යය සමග යෙදෙනුයේ ද මූර්ධන්‍ය ණකාරය මැයි.**

   නිදසුන් : පියාණ, පුතණු, මැණි, මලණ්ඩ ආදිය යි.

   සැ.යු. - ආණ ඈ ප්‍රත්‍යය යෙදෙන ශබ්ද සියලු කල්හි ම බුහු බසෙහි පමණක් වර නැඟේ.

5. **මූර්ධන්‍ය ණකාරය ආදි කොට ඇති ප්‍රකෘති සිංහලයේ ඉතා විරල ය.**

   සෘණ යන අරුතේ යෙදෙන <u>ණය</u>, සුණිසා හෙවත් ණැනා යන අරුතේ යෙදෙන <u>ණිය</u> යන ශබ්ද මීට නිදසුනි.

6. **සිංහලයෙහි තත්සම ව යෙදෙන පාළි සංස්කෘත ආදි ශබ්දවල ඇති ණකාරය නොවෙනස් ව ම සිටී.**

   නිදසුන්: අඞගණ, අධිකරණ, අනුක්‍රමණිකා, අරණ්‍ය, අවධාරණ, ආමන්ත්‍රණ, ආවේණික, කසිණ, ගණක, ගණිත, ගුණ, ශ්‍රෝණි, ඤාණ, පුෂ්කරණි, මාණවිකා, මරණ, සාධාරණ, වීණා

7. **සංස්කෘත පාළි ආදී භාෂාවෙකින් තත්භව වූ ශබ්දයෙක ද මුල් බසෙහි වූ මූර්ධන්‍ය ණකාරය නොවෙනස් ව සිටී.**

   නිදසුන් : අබරණ, කිකිණි, තණ, බමුණු, මෙණෙවි, වෙසමුණි, වියරණ, සැණකෙළි ආදියයි.

8. **පාළියෙහිත් සකුයෙහිත් ණකාර නකාර විශේෂයෙක් වේ නම් බෙහෙවින් සිංහල ශබ්දය පාළිය අනු ව වැටෙයි.**

| සකු | පාළි | සිංහල |
|---|---|---|
| ජානු | ජාණු | දණ |
| ඵේන | ඵේණ | පෙණ |
| ඥාන | ඤාණ | නැණ |

ඈ තැන්හි මෙනි.

9. **සිංහලයේ කිසි ම හලන්ත ප්‍රකෘතියෙක් මූර්ධන්‍ය ණකාරවත් ව නො සිටී. පර්යාය පාළි හෝ සකු හෝ ශබ්දය ණකාර සහිත වුව ද වර්තමාන සිංහලයේ එය දන්ත්‍ය නකාරවත් ව ම යෙ දේ.**

| පාළි / සක | සිංහල |
|---|---|
| කණ්ණ/ කර්ණ | කන් |
| වණ්ණ / වර්ණ | වන් (පැහැ) |
| ගෝණ | ගොන් |
| නිබ්බාණ / නිර්වාණ | නිවන් |
| රේණු | රොන් |

ආදිය නිදසුනි.

10. සංස්කෘත හෝ පාළි හෝ ශබ්දවල ට, ඨ, ඩ, ඪ යන අකුරුවලට මුලින් යෙදෙන හල් ණකාරය සියලු කල්හි ම මූර්ධන්‍ය ව සිටී.

නිදසුන්:

කණ්ඨක, මණ්ඩන, පණ්ඩිත, උත්කණ්ඨිත, අණ්ඩජ, තණ්ඩුල ආදිය නිදසුනි.

සැ. යු. වර්තමාන සිංහල ව්‍යවහාරයෙහි බොහෝ සෙයිනුත් පැරණි සාහිත්‍යයෙහි ඉතා විරලවත් දක්නට ලැබෙන 'න්ට' 'න්ඩ' යන ව්‍යවහාරයෙක් ද වේ. එහි ද දන්ත්‍ය නකාරය යෙදුණ ද උච්චාරණය මූර්ධන්‍යව ම කැරෙන බව සලකන්න.

යන්ට, එන්ට, දෙන්ට, දෙන්ඩ, කරන්ඩ ආදිය නිදසුනි. යන්නට, එන්නට, දෙන්නට, කරන්නට, කොටන්නට ආදිය ම වඩා යෝග්‍ය ඡෙකව්‍යවහාර බව සැලැකිය යුතු ය.

(විග්‍රහයේ සහ අවබෝධයේ පහසුව තකා උක්ත අක්ෂර හතර ආශ්‍රිත ව තැනෙන වචන කිපයක් ඉදිරිපත් කරමි.)

| ණ් ට | ණ් ඨ |
|---|---|
| කණ්ටක | අහිකුණ්ඨික |
| ඝණ්ටා | කණ්ඨක |
| ඝණ්ටාර | නිගණ්ඨ |
| නිසණ්ටුව | කණ්ඨක |

| ණ් ඩ | ණ් ඪ |
|---|---|
| අඛණ්ඩ | බණ්ඩක්කා |
| කණ්ඩායම | චණ්ඩියා |
| කෙණ්ඩිය | රණ්ඩු |
| ආණ්ඩුව | තුණ්ඩුව |
| මුරණ්ඩු | තොණ්ඩුව |
| සම්පිණ්ඩන | බිංකුණ්ඩා |
| දණ්ඩ | භාණ්ඩාගාරය |
| පිණ්ඩපාත | පණ්ඩිත |

11. සරණ, වරණ, විවරණ, මරණ, කරණ ආදි නා නා භාෂාන්තර ශබ්ද තත්සම ව යෙදෙන විට එහි වන මූර්ධන්‍ය ණකාරය සිංහලයෙහි ද යෙදේ.

එහෙත් කර, මර, සර, විවර ආදී රකාරාන්ත ධාතුවලින් සෑදෙන නු, න ආදී ප්‍රත්‍යය සහිත පද මුලින් ඇති රකාර හේතුවෙන් මූර්ධන්‍ය වීමෙක් සිංහලයේ නැත.

නිදසුන්:

i. ඔවුන් කරන වැඩ

ii වනේ සරන වැදි දන

iii හිසින් දරන බර

iv කරනු මැනවි

v බළලා විසින් සාවා මරන ලදි

ඈ තැන්හි මෙනි.

(අවබෝධයේ පහසුව තකා මෙහි දී ද 'ර' අක්ෂරයට පර ව 'ණ' යෙදෙන අයුරු විමසා බැලිය හැකි ය.)

| | | | |
|---|---|---|---|
| ර ණ | | | |
| සරණ | උපකරණ | මැතිවරණ | ධාරණය |
| අනුස්මරණ | ආස්තරණ | නවීකරණ | බහුවරණය |
| අසරණ | තීරණය | නිරාකරණය | සාධාරණය |
| ඉරණම | ආවරණය | පවාරණය | දෙරණ |
| තොරණ | උච්චාරණය | නිවාරණය | ප්‍රසාරණය |
| කාරණය | උදාහරණය | වාතාවරණය | ව්‍යාකරණය |
| ර් ණ | | | |
| අවතීර්ණ | කර්ණාටක | දුර්වර්ණ | නිර්ණායක |
| සංකීර්න | විච්චූර්ණ | මෙසවර්ණ | සප්තපර්ණ |
| සම්පූර්ණ | විස්තීර්ණ | වෛවර්ණ | ස්වර්ණ |
| අජීර්ණ | කර්ණිකාව | ජරාජීර්ණ | |
| රා ණ | | | |
| ඉරාණය | කුරාණය | පුරාණය | |
| රු ණ | | | |
| කරුණාව | වරුණාව | තරුණ | |
| රකාරාංශය | | | |
| අප්‍රාණික | ආමන්ත්‍රණ | කුමන්ත්‍රණ | සම්මන්ත්‍රණ |
| මිශ්‍රණ | සම්මිශ්‍රණය | මුද්‍රණය | ප්‍රාණ |
| පරිත්‍රාණ | | | |

12. උච්චාරණ දෝෂ හෙයින් එක් බඳු ව ඇසෙතත් කිසි තැනෙක්හි ණකාර, නකාර, විපර්යාසයෙන් අර්ථ විපර්යාසය සිදු වෙයි. එ හෙයින් කට වහරේ කෙසේ වෙතත් ලිවීමෙහි දී නකාර ණකාර දෙක විමසා යොදන්නට පුරුදු විය යුතු ය.

පහත දෙන නිදසුන් පිරික්සන්නඃ

| | |
|---|---|
| අණු | = සියුම්, සූක්ෂම |
| අනු | = පැසුළු, පශ්චාත් |

| | |
|---|---|
| උණු | = උෂ්ණ |
| උනු | = අඩු, ඌන |

| | |
|---|---|
| ගණ | = සමූහ |
| ගන | = ඝන, මේඝ |

| | |
|---|---|
| තණ | = තෘණ, තෘෂ්ණා |
| තන | = පියොවුරු, ස්ථන |

| | |
|---|---|
| උරණ | = කේන්ත |
| උරන | = උරා බොන |

| | |
|---|---|
| වණ | = තුවාලය |
| වන | = කැලෑව |

## සිංහලයේ මූර්ධන්‍ය ළකාර යෝගය

මූර්ධන්‍ය ළකාරය ද නිෂ්පන්න, තත්භව, තත්සම යන ත්‍රිප්‍රකෘතියෙන් ම සිංහලයෙහි යෙදෙනු දක්නට ලැබේ. මූර්ධන්‍ය ළකාරය සකුයෙහි නොලැබෙනුයෙන් සකු සද හා තත්සම ව යෙදෙන මූර්ධන්‍ය ළකාරයෙක් සිංහලයේ ද නැත. මූර්ධන්‍ය ළකාරය ආදි කොට ගත් ශබ්ද රූප පාළියෙහි ද නො වේ. ළකාරය ආදි කොට ගත් ශබ්ද ප්‍රකෘති එහෙයින් තත්සම හෝ තත්භව හෝ ගණයට නොවැටෙන සේ සැලැකේ.

1. නිෂ්පන්න ළකාරයට නිදසුන්ඃ

| ආදි ළකාරය | මැද සහ අග ළකාරය |
|---|---|
| ළ (හෘදය, සිත, තරුණ, යන අරුත්හි) | කොළොඹ (කොළඹ) |
| ළඟ (සමීප) | මුළු |
| ළිහිණි (කුරුලු) | මළ |
| ළද (තරුණ, ළා) | මොළ |
| ළු (හැන්ද) | රළ |
| ළිද | තුළ |
| ළිප | |
| ළපටි බාල නොමේරූ යන අරුත් දෙන පද | |
| ළද බොළඳ | |
| ළමා | |
| ළදරු | |
| ළපටි | |
| ළපලු | |
| ළහිරු | |
| ළදලු | |
| ළපැහැති | |
| වෙනත් අරුත් සඳහා | |
| ළඟාවෙයි | |
| ළං කරයි | |
| ළැව් ගිනි | |
| ළැහැබ් | |
| ළිහා ගනී | |
| ළිප් | |
| ළිහිල් | |
| ළිහිණි | |
| ළිඳ | |
| ළිං | |

2. තත්සම ව යෙදෙන මූර්ධන්‍ය ළකාරයට නිදසුන්:

| පාළි | සිංහල |
|---|---|
| ආළවි | අළවු |
| ඛේළ | කෙළ |
| තළාක | තළා |
| දළිද්ද | දිළිඳු |
| නළ | නළ |

3. අන්‍යස්වරයෙකින් යුක්ත ව තත්භව ව යෙදෙන මූර්ධන්‍ය ළකාරයට නිදසුන් :

| පාළි | සිංහල |
|---|---|
| ඒළක | එළු |
| කාළ | කළු |
| තේළස | තෙළෙස් |
| දළිම | දෙළුම් |
| මූළ්හ | මුළා |

4. සකුවෙහි හෝ පාළියෙහි හෝ දක්නට ලැබෙන ට, ඨ, ඩ, ඪ, ණ යන අකුරු ඇතැම් විට සිංහලයෙහි මූර්ධන්‍ය ළකාර වේ.

නිදසුන්

| පාළි / සකු | සිංහල |
|---|---|
| කාවාට පා | කවුළු |
| කෝටි පා. සං. | කෙළ |
| පඨම පා. | පළමු |
| පඨවි පා. | පොළොව |
| මකුට පා. | මුහුළු |
| | |

5. සිංහලයෙහි රකාරාන්ත ධාතුවලින් සැදෙන අතීතකාල ක්‍රියා ශබ්දයේ රකාරයට බොහෝ විට මූර්ධන්‍ය ළකාරදේශ වේ.

√ හර > හළ
√ අතුර > අතුළ
√ අඹර > අඹල
√ උතුර > උතුළ
√ විසුර > විසුළ
√ රුකුර > රුකුළ

ආදිය නිදසුනි.

සැ.යු. - මෙහි ලා 'බොහෝ විට' යි කියැවුණේ ඇතැම් ධාතුයෙක

අවබෝධයේ පහසුව සඳහා තවත් වචන කීපයක් ඇතුළු කරමි.

| ට<br>සකු | ට> ළ<br>පාළි | ඨ> ළ | ඩ> ළ | ඪ > ළ |
|---|---|---|---|---|
| සට> කළ | පටිකුල> පිළිකුල | පඨවි> පොළොව | බිඩාල > බළල් | ගුඪ > ගුළු |
| සාටක> සළු | පටික්ඛෙප> පිළිකෙව් | දඨා> දළ | ක්‍රීඩා > කෙළි | ආෂාඪ > ඇසළ |
| කක්කට> කකුළු | පටිපාටි > පිළිවෙළ | පඨම> පළමු | තඩාග > තළා | මූඪ > මුළා |
| කුක්කුට> කුකුළු | පටිපත්ති > පිළිවෙත් | පාඨ> පෙළ | බුබ්බුඩ > බුබුළු | දෘඪ > දළ |
| කිරීට> කිරුළු | පටිබන්ධ > පිළිබඳ | පීඨ> පිළ | ව්‍රීඩා > විළි | ප්‍රෞඪ > පුවළ |
| කුටි> කිළි | පටිකම්ම > පිළියම් | | ෂෝඩෂ> සොළොස් | |
| කුට > කුළු | - | | ගරුඬ > ගුරුළු | |
| භට > බළ | | | වෛරෝඩි > වෙරළු | |
| චක්‍රවාට > සක්වළ | | | | |
| ප්‍රකට > පළ | | | | |

හර { හළ
හැරි

මර { මළ
මැරුණු

වතුර { වතළ
වැතුරුණු

ඈ විසින් දෙ පරිද්දෙකින් ද තව සමහරෙක, එනම්,

√දර > දූරු
√පුර > පිරු
√පවර > පැවරු

ඈ විසින් ළකාරාදේශ නැති ව ම ද රූප සිද්ධි වන හෙයිනි.

**(සංස්කෘත හා සිංහල තවත් වචන කීපයක් ඉදිරිපත් කරමි.)**

| | |
|---|---|
| **හෘත > හළ** | **විසෘත > විසුළ** |
| **කෘත > කළ** | **පෘථුල > පුළුල්** |
| **මෘත > මළ** | |

6. ඟ, ද, ඹ යන අකුරුවලට පෙර ව බෙහෙවින් යෙදෙනුයේ මූර්ධන්‍ය ළකාරය යි.
ළඟ, ළඳ, සුළඟ, කොළඹ ආදිය නිදසුනි. මෙහි දි බෙහෙවිනැයි කියැවුණේ පොලඹ, සලඹ ඈ කිසි තැනෙක මූර්ධන්‍ය ළකාරය ජේකප්‍රයෝගයෙහි නොපැනෙන හෙයිනි.

7. මූර්ධන්‍ය ණකාරය සේ ම භාෂාන්තර ශබ්දවල දක්නට ලැබෙන මූර්ධන්‍ය ළකාරය ද සිංහලයේ ඒ අයුරු ම යෙදෙනු සිරිති.
ආළවක, පාළි, වේළුවන, මාළක ආදිය නිදසුනි.
සැලකිය යුතු :
මූර්ධන්‍ය ළකාර දෙකක් එක ළඟ යෙදෙන ශබ්දප්‍රකෘති සිංහලයෙහි දක්නට නො ලැබේ. සළෙල, උළෙල, අළල ආදි තන්හි ළකාරයත් ලකාරයත් මාරු වී, සලෙළ, උලෙළ, අලළ ආදි වශයෙන් ද සිටින සේ ජේකප්‍රයෝගයෙන් පෙනේ. මේ තන්හි ළකාර යෝගය විකල්ප ව සිටී.

(සම්මත සිංහල කම්ටු වාර්තාව, 1968 : 52 - 59)

ණ-න, ල-ළ සම්බන්ධයෙන් සම්මත රීතිය මේ ආකාරයෙන් ඉදිරිපත් කොට තිබුණ ද වත්මන් ලේඛන ව්‍යවහාරයේ දී ඒ සම්බන්ධයෙන් තව ද බොහෝ ගැටලු පැන නැගී තිබුණි. මේ අර්බුදය සමාප්තියකට පත් කර ගැනීමේ අටියෙන් 1987 වර්ෂයේ දී කුමාරතුංග ජන්ම ශත සංවත්සරය නිමිති කොට ගෙන ණ-න, ළ-ල භාවිතය පිළිබඳ දින කිපයක විද්වත් සමුළුවක් පැවැත්වුව ද එකඟතාවකට නො පැමිණ ම එය ද අවසන් විය. විවිධ විද්වතුන් විසින් මේ සඳහා කරනු ලැබූ පර්යේෂණ දෙස බලන විට පෙනී යන්නේ ද මේ ගැටලුව තවමත් විසඳී නැති බව යි. සැබැවින් ම එය ගණිත ගැටලුවක් විසඳන අයුරින් පහසුවෙන් විසඳිය හැක්කක් ද නො වේ.

**නූතනවාදී ප්‍රවණතාව**

1968 දි 'සම්මත සිංහලය' නම් වූ කමිටු වාර්තාව එළි දක්වෙන්නට පෙර සිට ම ණ-න, ළ-ල භාවිතය පිළිබඳ නූතනවාදී අදහස් ලංකා සමාජය තුළ ව්‍යාප්ත ව පැවති බව පෙනෙන්නට තිබේ. වැලිවිටියේ සෝරත නාහිමි 1956 දී පමණ මෙසේ ප්‍රකාශ කොට තිබුණ බව අජිත් තිලකසේන සිය කෘතියේ සඳහන් කොට ඇත්තේ මෙසේ ය.

වර්තමාන සිංහල හෝඩියේ අනවශ්‍ය අකුරු තිබේ දැයි පරීක්‍ෂා කර බලතොත් "ණ-න" යන දෙකින් එකක් ද "ළ-ල" දෙකින් එකක් ද අනවශ්‍ය බව කාටත් වැටහෙනු ඒකාන්ත යි. ණ-න යන දෙකක් හෝඩියේ තිබෙතත් ඒ දෙකින් ම දැන් ඇඳින්වෙන්නේ එක ම ශබ්දය යි. ඒ දෙකෙහි වෙනස ප්‍රකට වන සේ කියන්නට සමර්ථයෙක් අද සිංහලයන් අතර නැත. ල-ළ දෙක ද එසේ ම ය. පුරාතනයෙහි මේ අක්‍ෂරයන්ගේ උච්චාරණභේදය ප්‍රකට ව පෙනුණ හෙයින් මේ සියලු අක්‍ෂර රූප පුරාතන භාෂාවට අවශ්‍ය විය. උච්චාරණයෙහි වෙනසක් දැන් නො ලැබෙන හෙයින් මේ අක්‍ෂරයන් පුරාතන ක්‍රමය අනුව නිසි සේ යෙදීම අන්‍ය ජාතිකයිනට තබා සිංහලයන්ට ද අතිශය දුෂ්කර ය. එහෙයින් මේ අක්‍ෂර යුග්ම දෙකින් එකක් එකක් පමණක් ව්‍යවහාරයට ගැනීමට ජන සම්මතයක් වහාම ඇති කර ගත යුතු ය. මීට පටහැණිවන අතිපණ්ඩිතයන් ද සිටින බව අපි දනිමු. ඔවුන්ගේ මෝස තර්කයන් නො සැලකිය යුතු ය. අක්‍ෂර රූප දෙකක්වත් අඩු කර ලීම ටයිප්රයිටරය හා "මොනො ටයිප්" නම් ශීඝ්‍ර මුද්‍රණ යන්ත්‍රය ද සැදීමේ දි පහසුව පිණිස වෙයි.

(තිලකසේන අජිත්, 1978:100)

1968 සම්මත සිංහලය එළි දක්වෙන්නේ 1956 තරම් කාලයක දී න, ණ, ල, ළ භාවිතයෙහි පෙරළිකාරී වෙනසක් අපේක්ෂා කරමින් සිටියදී ය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එවකට සංස්කෘත මහාචාර්යවරයා වූ සිරිගුණසිංහයන් ද මේ අක්ෂර භාවිතය පිළිබඳ ස්වකීය මතය 1956 දී එළි දැක්වූයේ "මස් ලේ නැති ඇට" නම් කාව්‍ය සංග්‍රහය තුළිනි. ඊට පූර්ව පාඨයක් සපයමින් ඔහු එය අවධාරණය කොට සිටියේ මෙසේ ය."

"මෙම පොතේ ණ-ළ වෙනුවට හැම තැන ම න-ල යෙදුවේ උවමනාවෙනි."

(ගුණසිංහ සිරි, 1956)

සංස්කරණවාදී ආකල්පයක් මත ඉතා නිර්භීත අයුරින් සම්භාව්‍ය සහ සම්මුතිවාදී ලේඛන සම්ප්‍රදයෙන් පිට පැන සාහිත්‍ය කෘතියක් මුලින් ම රචනා කළ විද්වතා ඔහු වෙයි. එහෙත් එම කෘතියට හැඳින්වීමක් සැපයූ කේ. එන්. ඕ ධර්මදසයන් එම කෘතිය තුළ න-ණ, ල-ළ භාවිත කිරීමට තරම් නිර්භීත වෙයි. පහත දැක්වෙන්නේ සිරිගුණසිංහයන් ගේ ණ,ළ රහිත පද්‍ය ඛණ්ඩයකි.

<u>පන්ඩිතකම්</u> පොලු පහර වැදී
දරදඬු වී මහ ශිෂ්ටාචාරය
බොල් <u>පොලොව</u> බඳ ගෙන වැතිරී
සීතල හෙලුවැලි
<u>මලකඳක්</u> ලෙසින්
ඉදිමෙයි පිපිරෙයි <u>කුනුවෙයි.</u>
දවසින් දවසට දුගඳ හමයි.

(1956:26)

මේ කාව්‍ය කොටසෙහි පන්ඩිතකම්, පොලොව, වලාකුලක්, කුනුවෙයි යන වචනවල ණ සහ ළ භාවිත කොට නැති බව පැහැදිලි ය.

එසේ ම 1960 දි ඔහු විසින් රචිත 'හෙවණැල්ල' නම් නවකථාවෙහි ද ණ, ළ ඉවත් කොට ඇති බව පෙනී යයි. ඒ පිළිබඳ ව ලියනගේ අමරකීර්ති මෙසේ පවසයි.

"සාම්ප්‍රදයික අක්ෂර වින්‍යාසය නො සලකන් සිරිගුණසිංහගේ 'හෙවණැල්ල' නවකථාව ද එකල ජාතික සම්මානයක් දිනා ගත්තේ ය."

(ලියනගේ අමරකීර්ති, ලක්බිම, 2008.09.28)

මෙය තරමක් ප්‍රබල ප්‍රකාශයකි. ඊට හේතුව සාම්ප්‍රදයික අක්ෂර වින්‍යාසය ඛණ්ඩණය කළ කෘතියකට 1960 තරම් ඈත කාලයක දී සම්මානයක් ලැබීම යි. ඒ කාලය වන විට අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සංවාද සාකච්ඡා පැවතුණු යුගයක් බැවින් ලේඛන සම්ප්‍රදය ඉක්මවා ගොස් සාහිත්‍යකරණයේ නිරත වීම එක්තරා ආකාරයක නිර්භය පියවරක් සේ සැලකිය හැකි ය. කෙසේ නමුත් මේවායින් පැහැදිලි වන්නේ 1968 සම්මත සිංහල කම්ටු වාර්තාව එළිදක්වෙන කාලයට පෙර සිට ම නූතනවාදී අදහස් සමාජය තුළ මුල් බසිමින් තිබූ බව යි.

"සවස" නම් පුවත්පත ද මේ ප්‍රතිසංස්කරණවාදී අදහස් ප්‍රචලිත කිරීම අරබයා සම්පාදනය වූවකි. 1964 දී සවස පුවත්පතෙහි ප්‍රථම සංවත්සරය පැවැත් වූ දිනයෙහි අපූරු තීන්දුවක් ගැනිණි. එනම් "නවීන යුගයට ගැළපෙන භාෂාවක් වශයෙන් ඉදිරියට යන්නට ඉඩ නො තබා සිංහලය පස්සට තල්ලු කළ ණ-න, ළ-ල, අවුල වළලා දැමීම භාෂාවේ දියුණුව අතින් ගව් ගණනක් ඉදිරියට පනින මහා පිම්මක්" වශයෙන් සලකා එම පුවත්පත ණ-න, ළ-ල භේදය මුළුමනින් ම අත්හැර ද තිබීමයි. (තිලකසේන අජිත්, 1978:100)

අජිත් තිලකසේන නම් ලේඛකයා ද 1978 දි රචනා කළ 'මල් වැනි ගල්' නම් සංයුක්ත කාව්‍ය කෘතියෙන් භාෂා සංස්කරණයක් අපේක්ෂා කරමින් ණ, ළ අක්ෂරවලින් මුළුමනින් ම ඉවත් විය. එතැන් සිට ඔහු රචනා කළ සැම කෘතියක ම වාගේ ණ, ළ දක්නට ලැබුණේ නැත.

මේ අනුව බලන විට සම්මත සිංහල කම්ටුවේ වාර්තාව නිකුත් වන්නට පෙර සිට ම පැවතුණු ණ-න, ළ-ල ගැටලුව අද වනතුරුත් විසඳී නැති බව පෙනේ. කලින් කලට සංස්කරණවාදී රචනා එළිදැක්වුණ ද ඊට කළ හැකි විශාල බලපෑමක් මේ වනතුරුත් දක්නට නො ලැබේ. ඊට හේතුව වන්නේ අධ්‍යාපනික ක්ෂෙත්‍රය තුළ

සාම්ප්‍රදායික ලේඛන රීතිය සම්මත වී ඇති බැවිනි. අජිත් තිලකසේන පිළිබඳ ව ලියනගේ අමරකීර්ති ප්‍රකාශ කළේ මෙවැන්නකි.

"නොයෙකුත් භාෂා ප්‍රේමීන් 'අටවක පුත්තු' නවකථාවට එල්ල කරන ප්‍රහාරය දකින විට භාෂා සංස්කරණය සම්බන්ධයෙන් මට වඩා බෙහෙවින් රැඩිකල් කෙනෙකු වන ශ්‍රේෂ්ඨ ලේඛක අජිත් තිලකසේනගේ ධෛර්යය ගැන පුදුම වී සිටීම අමාරු ය."

(ලක්බිම, 2008.09.28)

2008 දී ලියනගේ අමරකීර්ති 'අටවක පුත්තු' නම් නවකථාව රචනා කළේ ණ, ළ, ෂ, ඵ යන අක්ෂරවලින් පූර්ණ ලෙස බැහැර වෙමිනි. එහෙත් එම නවකථාවට, වසරේ සාහිත්‍ය සම්මානය ද හිමි විය. අමරකීර්ති ඒ පිළිබඳ ව මෙසේ ප්‍රකාශ කොට තිබුණි.

"සිංහලය සුබනම්‍ය බසකි. එය ස්වාධීන බසකි. එය තව දුරටත් එහි මව් භාෂා යැයි සැලකෙන සංස්කෘත වැනි භාෂාවල හෙවණැල්ල යට සිර කර තැබිය යුතු නැත. සිංහලයෙහි චිර පැවැත්ම සඳහා එය හැකි තරම් ලිහිල් කළ යුතු ය. ළ, ණ, ෂ, ඵ අකුරු හතර වෙනුවට ල, න, ශ, ප යෙදීම නිසා සිංහලයේ කිසිම වචනයක අර්ථයක් විකෘති නො වන බවත්, වචනවල අර්ථය එන්නේ සංදර්භයෙන් මිස අක්ෂර වින්‍යාසයෙන් නො වන බවත් මා අන් තැනක සවිස්තර ව පෙන්වා දී ඇත. ලේඛන සිංහලයේ රූපිය ස්වරූපය (අක්ෂර වින්‍යාසය වැනි) හැකි තරම් ලිහිල් කිරීම සිංහලයේ අනාගතයට හොඳ ය." (එම)

**පාරිභාෂික වචන**

විදේශීය වචන සඳහා සිංහල භාෂාවට පාරිභාෂික වචන සැපයීමේ දී බොහෝ දුරට සංස්කෘත භාෂාවේ මූලයන් සොයා යන ආකාරය පෙනෙන්නට තිබේ. වත්මනෙහි සිංහල භාෂාව සතු ව තිබෙන බොහෝ පාරිභාෂික වචන සංස්කෘත භාෂා මූලයන්ගෙන් තැනුණු ඒවා ය. ඉන් පෙනී යන්නේ සංස්කෘත භාෂාවට අදත් කිසියම් වටිනාකමක් සිංහල භාෂාව තුළ ලැබී ඇති බව යි. මේ සංස්කෘත වචන පරිහරණය කිරීමේ දී 'ණ' අක්ෂරය අනිවාර්ය වේ. සංස්කෘත භාෂාවෙහි 'ළ' අක්ෂරය නොමැති බැවින් ඒ පිළිබඳ ගැටලුවක් උද්ගත නොවෙතත් 'ණ' අක්ෂරය යෙදීමට සිදුවෙන නිසා එය භාවිතාවෙන් බැහැර කළහොත් ඇති වන ප්‍රශ්නය කෙබඳු වෙයි ද?

විශේෂයෙන් ම ලියනගේ අමරකීර්ති නම් වූ සංස්කරණවාදී ලේඛකයා ද ස්වකීය ග්‍රන්ථකරණයේ දී පරිහරණය කළ පාරිභාෂික වචන පහත දක්වෙයි. ඒවාහි මූර්ධන්‍ය 'ණ' අක්ෂරය යොදා තිබුණි.

| | |
|---|---|
| Inter – disciplinary | අන්තර් ශික්ෂණාත්මක |
| Hermeneutic circlc | අර්ථ විවරණවේදමය |
| Focalization | නාභිගතකරණය |
| Myth | පුරාණෝක්තිය |
| Speech act theory | භාෂණ ක්‍රියා න්‍යාය |

(ලියනගේ අමරකීර්ති, 2008: 405-406)

| | |
|---|---|
| Interior – monologue | අන්තර්භාෂණය |
| Fe- familiarization | අසාමාන්‍යකරණය |
| Objectification | ද්‍රව්‍යකරණය |
| Representation | ප්‍රතිනිර්මාණය |
| Truthfulness | සත්‍යපූර්ණභාවයය |
| Tunneling | ප්‍රවාහීකරණය |

(ලියනගේ අමරකීර්ති, 2005: 335-336)

**නිගමනය**

න-ණ-ල-ළ පිළිබඳ ව දීර්ඝ කාලයක සිට වාද විවාද පවත්වා ඇති බව මෙකී කරුණුවලින් තහවුරු වේ. විශේෂයෙන් ම ගුරු කුල දෙකකට බෙදී කරුණු ඉදිරිපත් කිරීම නිසා න-ණ-ල-ළ යෙදීමේ කේවල ක්‍රමයක් පවත්වා ගෙන යාම අසීරු වී තිබේ. පාසල් පද්ධතිය තුළත්, විශ්වවිද්‍යාල ආදී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත්, සම්මත සිංහල කමිටු වාර්තාවෙහි නිර්දේශිත රීති පවත්වා ගෙන යාමට හැකි වුව ද ඉන් ඔබ්බට ගිය කල්හි නිදහස් අදහස් දරණ මතවාදීන්, සංස්කරණවාදීන් ලෙස පෙනී සිටිමින් ස්වඅභිමතය පරිදි ක්‍රියා කරන ආකාරය ද දැකිය හැකි වෙයි. ඊට හේතුව වන්නේ සිංහල කමිටු වාර්තාව බිහිවූයේ සමස්ත ශාස්ත්‍රඥයන්ගේ පූර්ණ එකඟතාව මත නො වීම යි. ඊට ප්‍රතිපක්ෂ ව අදහස් දැක් වූ කණ්ඩායමේ මත ක්‍රියාත්මක නොවීම නිසා එකී සංස්කරණවාදී ව්‍යාපාරය ද ඊට සමගාමී ව ගමන් කරන බව පෙනේ.

"භාෂාව යනු මිනිසුන්ට ඔවුනොවුන් අතර සන්නිවේදනය පවත්වාගැනීම සඳහා තිබෙන උපකරණයක් බවත් , ලොව පවතින දේ සහ ඒවාට ප්‍රතිචාර වශයෙන් මිනිස් සිත්හි උපදින හැඟීම් මෙහි දී සන්නිවේදනය කෙරෙන බවත්, බාහිර ලෝකය නො පවත්නේ නම් මිනිස් හැඟීම් පැවසීම සඳහා භාෂාවක්

නොමැති බවත් ආදි වශයෙන් විවිධ අදහස් ඇතැම් විචාරකයන් විසින් ඉදිරිපත් කරනු ලැබුවත් භාෂාවක ලේඛන රීතිය ශක්තිමත් ව පවත්වාගෙන යාම අනිවාර්යයෙන් ම සිදු කළ යුත්තකි. කථන ව්‍යවහාරය සඳහා පූර්ණ නිදහස ස්වභාවයෙන් ම ඊට උරුම වුව වී ඇතිවා සේ ම ලේඛන ව්‍යවහාරය සඳහා සම්මත ව්‍යාකරණ නීති රීති සුරක්ෂිත කිරීම ද සිදු කළ යුත්තේ ය.

